**IPRC/16/308**

# ජයශංකර් ප්‍රසාද්ගේ 'කාමායනී' මහා කාව්‍යයෙන් පිළිඹිබුවන බෞද්ධ ආගමික සංකල්ප.

අචලා කාරියකරවණ[1*]

ජයශංකර් ප්‍රසාද් හින්දී සාහිත්‍යයේ ඡායාවාදී යුගයේ ප්‍රධාන සාහිත්‍යධරයන්ගෙන් එක් අයකු ලෙස හැඳින්විය හැක. ප්‍රසාද් හින්දී සාහිත්‍යයේ සෑම අංගයක්ම පෝෂණය කරමින් හින්දී සාහිත්‍යයට කළ සේවාව අද්විතීය වේ. ඔහුගේ රචනාවන් අතුරින් 'කාමායනී' මහාකාව්‍යයට හිමිවන්නේ ප්‍රමුඛ ස්ථානයකි. 'කාමායනී' මහාකාව්‍යයට බුදුදහමේ බලපෑම ලැබී ඇති බව පැහැදිලි කරුණකි. සමාජයෙන් මිනිස්කම පිරිහී යන විට සමාජ ව්‍යුහය තුළ ඇති වන ව්‍යසනයන් පිටුදැක යහපත් සමාජයක් ගොඩ නගා ගැනීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම බුදුදහමෙන් සිදුවන කර්තව්‍යයකි. එමෙන්ම ශීඝ්‍රයෙන් පිරිහී යන මානුෂික ධර්මතා ප්‍රතිෂ්ඨාපනය කොට මිනිසා සැබෑ මිනිසකු බවට පත්කිරීමද බුදුදහමින් අපේක්ෂිත තවත් අරමුණකි. එවන්වූ අරමුණු 'කාමායනී 'මහාකාව්‍යයෙන්ද විද්‍යමානවේ.

***ප්‍රමුඛ පද:*** කාමායනී, මහාකාව්‍යය, හින්දී සාහිත්‍යය, ඡායාවාදය, මානුෂික ධර්මතා

[1] කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව *gayankrishantha9@gmail.com